# සිංහල

## 5 ශ්‍රේණිය




Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 7 පාඩම

## ප්‍රථම පුරුෂ නාම පද යොදා වැකි ලියමු.

### පියවර 1

- පහත සඳහන් වැකි හඬනඟා කියවමු.

අශ්වයා වේගයෙන් දුවයි.

එළදෙන පැටියාට කිරි දෙයි.

සමනලයා මල් පැණි බොයි .

කම්කරුවෝ වැඩ කරති.

වෛද්‍යවරු රෝහලට යති.

මිනිස්සු නගරයට යති.

### පියවර 2

- ඔබ කිය වූ වැකි වතර්මාන කාලයට අයත් වැකි වන අතර අපි අතීත කාලයට අයත් වැකි ද කියවමු.

මිනිස්සු වෙහෙසී වැඩ කළහ.

ළමයි සතුටින් සෙල්ලම් කළහ.

නැන්දලා රසවත් කෑම සෑදුවෝය.

ගුරුවරු පාසලට පැමිණියෝය.

කාන්තාවෝ කඩිසර ව වැඩ කළෝය.



අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක

.

## පියවර 3

- අපි දැන් පහත කොටුවේ දී ඇති ක්‍රියා පද යොදා වැකි නිවැරදිව සම්පූර්ණ කරමු.

| | |
|---|---|
| දුන්නේය | කියවූහ |
| බිරුවෝය | කියවූවාය |
| ගායනා කරයි | කළෝය |
| ගැයුවාය | සාදයි |

1. මී මැස්සා මී වදය .........................
2. තාත්තා අපට අවවාද ...................
3. අක්කා පොතක් .................
4. ගායකයා මිහිරි ගීතයක් .................
5. ගායිකාව මිහිරි ගීතයක් ...................
6. අයියලා පුස්තකාලයේ පොත් .............................
7. කුරුල්ලෝ ඉහළ අහසේ පියාසර ..................
8. බල්ලෝ රාත්‍රී කාලයේ සොරුන්ට ........................

<u>දැනුම පොතට</u>

සෙනසුරු යනු සූයර්යාගේ සිට ඇති හයවන ග්‍රහලොව වන අතර සෞරග්‍රහ මණ්ඩලයේ බ්‍රහස්පතිට පසුව එන දෙවන විශාලතම ග්‍රහලෝකයයි.
සෙනසුරුගේ වායුගෝලය සෑදී ඇත්තේ හයිඩ්‍රජන් විශාල ප්‍රමාණයක්, හීලියම් සුළු ප්‍රමාණයක් හා තවත් මූලද්‍රව්‍ය කිහිපයක එකතුවෙනි.
මෙය නම් කරන ලද්දේ රෝමානු දෙවියකු වූ සැටනර්ස් නමිනි.



(කට පාඩම් නොකරන්න. දැනමට පමණයි.)



අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක